**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා වූ විවෘත තරග විභාගය - 2019(2020)**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා වූ විවෘත තරග විභාගයට අදාළ බඳවා ගැනීමේ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,194 හා 2020.09.18 දිනැති ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධියට පත්කර ඇත. සුදුසුකම් සපුරා ඇති අය මේ මේ සඳහා ඉල්ලුම් කළ හැකි බව දන්වමි.

http://www.documents.gov.lk/files/gz/2020/9/2020-09-18(I-IIA)S.pdf

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,194 - 2020 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1364 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1366 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට මෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ඔක්තෝම්බර් මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 සැප්තැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1361 - B 82059 — 5,403 (2020/09)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## විශ්වවිද්‍යාල රෝහල

### ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් වෘත්තිකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **විශේෂඥ වෛද්‍ය නිලධාරි :**

- විශේෂඥ වෛද්‍ය නිර්වින්දන (හෘද සහ උරස් ශල්‍ය කර්ම නිර්වින්දනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.)
- විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍ය
- විශේෂඥ වෛද්‍ය දූඩිසත්කාර
- විශේෂඥ වෛද්‍ය චර්ම රෝග
- විශේෂඥ වෛද්‍ය විද්‍යුත් භෞතවේද හෘද රෝග
- විශේෂඥ වෛද්‍ය ලිංගාශ්‍රිත රෝග
- විශේෂඥ වෛද්‍ය හදිසි ප්‍රතිකාර
- විශේෂඥ වෛද්‍ය වකුගඩු රෝග
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය වාහිණික සහ අවයව බද්ධ කිරීම්
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය උගුර, කන, නාසය
- විශේෂඥ වෛද්‍ය ක්‍රීඩා
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය හෘද සහ උරස් සැත්කම්
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය මුඛ, හනු, මුහුණු
- විශේෂඥ වෛද්‍ය ළමා හෘද රෝග
- විශේෂඥ වෛද්‍ය දත්ත සංරක්ෂණ
- විශේෂඥ වෛද්‍ය අධිකරණ
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය ප්ලාස්ටික් සැත්කම්
- විශේෂඥ වෛද්‍ය විකිරණ

*සුදුසුකම් :*

i. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විය යුතුය;

හෝ

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු වීම;

සහ

iii. විශේෂඥ වෛද්‍ය (MD/MS) උපාධිය සමග කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* I වන ඇමුණුම);

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MC 1-2-රු. (91,645 - 12 x 2700 - රු. 124,045)

02. **වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය**

*සුදුසුකම් :*

i. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම ;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෝහලක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමක කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල් හෝ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම;

සහ

iii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරණ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම;

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1,910 - 10 x2,270 -රු. 99,015)

* වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ. - රු. 78,585

03. **දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය :**

*සුදුසුකම් :*

i. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෝහලක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල් හෝ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක II වන ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර නවයක (09) පළපුරුද්ද ලබා තිබීම;

සහ

iii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරණ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම;

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1910 - 10 x2,270 - රු. 99,015)

* දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ. - රු. 78,585

04. **වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය :**

*සුදුසුකම් :*

i. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රෝහලක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල් හෝ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම;

සහ

iii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1,910 - 10 x2,270 - රු. 99,015)

* වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 5 හි තබනු ලැබේ. - රු. 64,185

05. **දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය :**

*සුදුසුකම් :*

i. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1,910 - 10 x2,270 - රු. 99,015)

* දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 1 හි තබනු ලැබේ. - රු. 58,675

06. **වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය :**

*සුදුසුකම් :*

i. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

සහ

ii. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද චරිත සහතිකයක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

MO 1 -1 රු. (58,675 - 3 x 1,375 - 7 x 1,385 - 2 x 1,910 - 10 x2,270 - රු. 99,015)

* වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 2 හි තබනු ලැබේ. - රු. 60,050

**පොදු කොන්දේසි**

සෑම ඉල්ලුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iv. අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

v. මෙම තනතුරු ස්ථිර වන අතර වෛද්‍ය නිලධාරී ප්‍රාථමික ශ්‍රේණිය වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර විශේෂඥ වෛද්‍ය, වෛද්‍ය නිලධාරී I ශ්‍රේණිය, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී I ශ්‍රේණිය, වෛද්‍ය නිලධාරී II ශ්‍රේණිය සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී II ශ්‍රේණිය යන තනතුරුවල රාජ්‍ය සේවයෙහි රැකියාවෙහි නියුතුව සිටි නිලධාරීන් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.

vi. විශේෂඥ වෛද්‍යවරුන් වෛද්‍ය සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨ සිසුන්ගේ ඉගැන්වීම් සහ පුහුණුවීම් කටයුතුවලටද පශ්චාත් වෛද්‍ය අධ්‍යාපන කටයුතුවලටද දායක විය යුතු අතර මෙම කාර්යය වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මග පෙන්වීම යටතේ සිදුකල යුතුය.

vii. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක් ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද, දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව),

viii. දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කල යුතුය.

ix. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල රෝහල සතුවේ.

x. ඉල්ලුම්පත්‍ර සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2020.09.30 දිනට පෙර "විධායක අධ්‍යක්ෂක, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල, වේරහැර" යන ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්පතෙහි ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

xi. අසම්පූර්ණ, ප්‍රමාද වී යොමු කරනු ලබන සහ නියමිත ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

xii. අයදුම්පත්‍ර සහ අදල අනෙකුත් විස්තර බාගත කිරීම සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න. www.kdu.ac.lk

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න,
ඩබ්ඩබ් ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී
ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් සහ,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව
විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති.

09-639

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)**
**2020 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතනවලට සිසුන් බඳවා ගැනීම**

2020.09.04 දින පළවූ අංක 2192 *ගැසට් පත්‍රයේ* 09-348 නිවේදනයේ අංක 10 පහත පරිදි සංශෝධනය විය යුතුයි. :-

10. **උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English)**

10.1 පූර්ණ කාලීන- වසර 2 1/2ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම ;

සහ

අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම ;

හෝ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ;

හෝ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍ය කෘතීන් ඇගයීම යන විෂයයට සාමාර්ථයක් ලබා තිබීම.

එසේම, අංක 05 සිට 13 දක්වා වගුව සංශෝධනය විය යුතුය.

| | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 06 | උසස් තාක්ෂණ ආයතනය - දෙහිවල | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 | HNDIT (FT), HNDA (FT), HNDM (FT), HNDBA (FT), HND in English (FT), HNDB F(FT), HNDTHM(FT), HNDA (PT), HND in English (PT) |
| 10 | උසස් තාක්ෂණ ආයතනය - මහනුවර | අංක 16, කැප්පෙටිපොල මාවත, මහනුවර | 081-2232097<br>081-2226644 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HNDBA(FT), HND in English (FT), HNDTHM (FT), HNDA (PT),HND in English (PT), HNDIT (PT) |

ආචාර්ය කේ. එල්. ජයරත්න,
අධ්‍යක්ෂ ජනරාල්,

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

ඉංජිනේරු. ජේ. එච්. ගුණරත්න මිය,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
(අධ්‍යයන කටයුතු/සැලසුම් හා පර්යේෂණ ආයතනය)
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.

09-602

---

## AQUINAS COLLEGE OF HIGHER STUDIES

වෘත්තීය හා තෘතියික කොමිෂන් සභාවේ ලියාපදිංචි
(**P01/0023**)
**NVQ** 5 මට්ටමේ පාඨමාලා
2021 වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

- **වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව**

01. කෘෂි කාලගුණ විද්‍යාව Agro Metrology/02. පාංශු රසායන විද්‍යාව Soil Chemistry/03. මූලික උද්භිද විද්‍යාව Basic Botany/04. තවාන් පාලනය Nursery Management/05. මූලික පරිසර විද්‍යාව Basic Ecology/06. කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව Agriculture Engineering/07. පැළෑටි සංරක්ෂණය Plant Protection/08. වැවිලි ව්‍යාප්ති අධ්‍යාපනය Extension Education/09. තේ වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Tea Cultivation & Production Processing Technology/10. රබර් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Rubber Cultivation & Production Processing Technology/ 11. පොල් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Coconut Cultivation & Production Processing Technology/12. උද්‍යාන විද්‍යා Horticulture /13. වැවිලි ගණකාධිකරණය Plantation Accounting/14. වැවිලි ආර්ථික විද්‍යාව Plantation Economics/15. කළමනාකරණය Management/ 16. කෘෂි වන වගාව Agro Forestry/17. අපනයන කෘෂි භෝග Export Agri Crop/18. උක් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Sugarcane Cultivation & Production Processing Technology/19. කජු වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Cashew Cultivation & Production Processing Technology/20. තල් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Palmyra Cultivation & Production Processing

Technology/21. කටු පොල් වගාව සහ නිෂ්පාදන සකස් කිරීමේ තාක්ෂණය Oil Palm Cultivation & Production Processing Technology/22. ගිනිසඩියා වගාව සහ බලශක්ති නිෂ්පාදන තාක්ෂණය Ginisidia Cultivation & Enargy Power Technology/23. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යනය Introduction to Laboratory Research & Agricultural Field Research 24. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation (සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුලත්ය.)

කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

- **කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව**

01. කෘෂි කාලගුණ විද්‍යාව Agro Metrology/02. පාංශු රසායන විද්‍යාව Soil Chemistry/03. මූලික උද්භිද විද්‍යාව Basic Botany/04. තවාන් පාලනය Nursery Management /05. ජාන ඉංජිනේරු විද්‍යාව Genatical Engineering/ 06. ජල විද්‍යාව Hydrology/07. ජල කළමනාකරණ තාක්ෂණය Irrigation Management Technology/08. කෘෂි යාන්ත්‍රිකරණ ශිල්ප තාක්ෂණය Farm Machinery Technology 09. කෘෂිකාර්මික උපකරණ පිළිබඳ ශිල්පීය තාක්ෂණය Agriculture Instruments Technology/ 10. කෘෂිකර්ම සිවිල් ඉංජිනේරු විද්‍යාව Agriculture Civil Engineering/ 11. වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණය Plantation Crop Production Technology/(පොල් වගාව Coconut Cultivation/රබර් වගාව Rubber Cultivation තේ වගාව Tea Cultivation/අපනයන කෘෂි බෝග වගාව Export Agri Crop (ගම්මිරිස්/කරාබුනැටි/ කොකෝවා/ කෝපි/ එනසාල්/කුරුඳු/සාදික්කා/වැනිලා)/ 12. උද්‍යාන විද්‍යාව Horticulture/13. කෘෂි මෝටර් කාර්මික විද්‍යා තාක්ෂණය Agri Motor Mechanism Technology 14. පැළෑටි සංරක්ෂණ තාක්ෂණය Plant Protection Technology/ 15. සත්ත්ව නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු විද්‍යාව Livestock Production Technology /16. වී වගාව සහ සකස් කිරීමේ තාක්ෂණය Paddy Cultivation & Production Processing Technology /17. පසු අස්වනු තාක්ෂණය Post Harvest Technology /18. වෙනත් ක්ෂේත්‍ර බෝග තාක්ෂණය Other Field Crop Technology /19. කළමනාකරණය Management / 20. ව්‍යාපාර කළමනාකරණය හා ගොවිපල් කළමනාකරණය Farm Economics & Accounting /21. ව්‍යාප්ති අධ්‍යාපනය Extension Education /22. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යනය Introduction to Laboratory Research & Agricultural Field Research/ 23. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation (සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුලත්ය.)

කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

- **සත්ත්ව පාලනය ඩිප්ලෝමා පාඨමාලාව**

01. කෘෂි කාලගුණ විද්‍යාව Agro Metrology /02. පාංශු රසායන විද්‍යාව Soil Chemistry /03.තෘණ සහ පෝෂ නිෂ්පාදන තාක්ෂණය Pasture & Fodder /04. සත්ත්ව පෝෂණ මූලධර්ම Animal Nutrition /05. සත්ත්ව ව්‍යුහ විද්‍යාව සහ කායික විද්‍යාව Animal Anotomy & Physiology /06. සත්ත්ව අභිජනනය Animal Breeding /07. කිරි එළදෙනුන් පාලනය Cattle Management /08. බෝග නිෂ්පාදනය Crop Production /09. එළු පාලනය Goat management / 10. බැටළු පාලනය මොඩියුලය Sheep Management /11. සූකර පාලනය Swine Management/12. කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව Agriculture Engineering /13. කිරි සහ කිරි නිෂ්පාදන තාක්ෂණය Milk & Dairy Product Technology /14. මස් සහ මස් නිෂ්පාදන තාක්ෂණය Meat & Meat Product Technology/15. බිත්තර නිෂ්පාදනය, තත්ත්ව පාලනය සහ බිත්තර රැක්කවීමේ තාක්ෂණය Egg Products & Egg Quality Control & Incubate System Technology/16. සත්ත්ව සෞඛ්‍ය Animal Health /17. මහජන සෞඛ්‍යය Public Health /18. කුකුල් පාලනය Poultry Management /19. මත්ස්‍ය වගාව සහ වෙනත් ජලජීවී වගා පාලනය Fish Culture & Aquaculture /20. ව්‍යාප්ති අධ්‍යාපනය Extension Education 21. කළමනාකරණය Management/22. උද්‍යාන විද්‍යාව Horticulture 23. වෙනත් ගෘහ ආශ්‍රිත සතුන් ප්‍රභේද Other Species of Domestic Animal (හා පාලනය Rabbit management /වටු පාලනය Quail Management/මී මැසි පාලනය Bee Keeping) /24. ගොවිපල් ආර්ථික විද්‍යාව හා ගොවිපල් කළමනාකරණය Farm Economics & Accounting /25. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යනය Introduction to Laboratory Research & Agricultural Field Research/ 26. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation (සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුළත්ය.)

කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

- **මල් වගාව හා උද්‍යාන අලංකරණය ඩිප්ලෝමා පාඨමාලාව**

01. කෘෂි කාලගුණ විද්‍යාව Agro Metrology/02. පාංශු රසායන විද්‍යාව Soil Chemistry/03. මූලික උද්භිද විද්‍යාව Basic Botany/04. උද්‍යාන අලංකරණ මූලධර්ම Principle of Landscape /05. උද්‍යාන අලංකරණයේ ඉතිහාසය හා විකාශනය Landscape History & Divolopment/06. උද්‍යාන අලංකරණයට අදාල ගුණාත්මක පරිසර විද්‍යාව Landscape Qualitative Ecology/07. තවාන් පාලනය Nursery Management/08. උද්‍යාන අලංකරණයට අදාල උද්‍යාන විද්‍යාව Landscape Amenity Horticulture 09. උද්‍යාන අලංකරණයට අදාල රුක් හා ලඳු වගාව Landscape Arboriculture/10. උද්‍යාන අලංකරණයට අදාල ඉංජිනේරු විද්‍යාව Landscape Engineering/11. ජල සම්පාදන තාක්ෂණය Irrigation Technology/12. මෘදු උද්‍යාන අලංකරණ භාවිත Soft Landscape 13. උද්‍යාන අලංකරණ භාවිත Hard Landscape/14. උද්‍යාන අලංකරණ ආකෘති හා සිතුවම් නිර්මාණ තාක්ෂණය Design Technics for Hard Landscape Item/ 15. ශාක ප්‍රචාරණය සහ ශාක අභිජනන මූලධර්ම Plant Propagation & Breeding Fundamental/16. පැළෑටි සංරක්ෂණය Plant Protection/17. කළමණාකරණ මොඩියුලය Management/18. ව්‍යාපාර කළමනාකරණය හා ගොවිපල් කළමනාකරණය farm Economics & Accounting/19.

මල් වගාව Floriculture/ 20. උද්‍යාන අලංකරණය සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම Landscape Estimating/21. ආරක්ෂිත බෝග වගා තාක්ෂණය හා හරිතාගාර තාක්ෂණය Protected Cultivation & Green House Technology/22. උද්‍යාන අලංකරණයට අදාල නීතිමය අධ්‍යනය Landscape of Legal aspects & Landscape Design Management/23. උද්‍යාන නඩත්තු කටයුතු Landscape Maintainers/24. ජාන ඉංජිනේරු විද්‍යාව Genatical Engineering/ 25. වෙනත් විශේෂ උද්‍යාන අලංකරණ භාවිතය Other Item of Landscape (තණ පිඩැලි සිටුවීමේ තාක්ෂණය/පරිනත ශාක ගලවා සිටුවීමේ තාක්ෂණය/බිම් ගඩොල් ඇතිරීමේ තාක්ෂණය/බොන්සායි වගාව)/26. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යයනය Introduction to Laboratory Research & Agricultural Field Research/27. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation (සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුලත්ය.)

කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

- ආහාර විද්‍යාව සහ තාක්ෂණය ඩිප්ලෝමා පාඨමාලාව

01. මූලික රසායන විද්‍යාව Basic Chemistry/ 02. ආහාර රසායනය Food Chemistry/03. ආහාර ක්ෂුද්‍ර ජීව විද්‍යාව Food Micro Biology/04. ආහාර අමු ද්‍රව්‍ය සහ රස ද්‍රව්‍ය ගබඩාකරණය Food Row Material & Ingredients/05. ආහාර විද්‍යා මූලධර්ම Principle of Food Science/06. ආහාර සංරක්ෂණ තාක්ෂණය Food Preservation Technology/07. ආහාර ඉංජිනේරු විද්‍යා මූලධර්ම Principle of Food Engineering/08. ධාන්‍ය, පලතුරු සහ එළවළු පසු අස්වනු තාක්ෂණය Post Harvest Technology/09. ධාන්‍ය ආහාර රසායනය Cereal Chemistry/10. බේකරි (පෝරණු) කර්මාන්ත තාක්ෂණය Bacery Confectionery Technology/11. කිරි සහ කිරි නිෂ්පාදන සකස් කිරීම Milk & Dairy Products Technology/12. මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන සැකසීම Fish & Fishery Products Technology/13. මස් සහ මස් නිෂ්පාදන තාක්ෂණය Meat & Meat Products Technology/14. මානව පෝෂණය Human Nutrition/15. බීම සහ බීම කර්මාන්ත තාක්ෂණය Distilling & Manufacture of Other Beverages/16. ආහාර ඇසුරුම්කරණය Food Packaging/17. ඓන්ද්‍රීය ඇගයීම් තාක්ෂණය Sensory Evaluation Technology/18. ආහාර විශ්ලේෂණය හා තත්ත්ව පාලනය Food Analysis & Quality Control/19. ආහාර ගබඩාකරණ තාක්ෂණය Food Storage Technology/20. ආහාර කර්මාන්තශාලා සනීපාරක්ෂණය හා ආරක්ෂණ තාක්ෂණය Factory Sanitation & Safe Processing Technology/21. අපද්‍රව්‍ය බැහැර කිරීම හා ප්‍රයෝජ්‍යකරණය Waste Disposal & Utilization/22. ආහාර තත්ත්ව කළමනාකරණ පද්ධති හොඳ නිෂ්පාදන පුරුදු Food Quality Management System/23. ආහාර සකස් කිරීමේ තාක්ෂණය Food Processing Technology/24. වෙනත් ආහාර කර්මාන්ත තාක්ෂණය Other Food Confectionery Technology/25. කළමනාකරණය Management/26. විද්‍යාගාර පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ අධ්‍යනය Introduction to Laboratory Research & Agricultural Field Research/27. පර්යේෂණ නිබන්ධනය සහ ඉදිරිපත් කිරීම Theses & Presentation (සෑම මොඩියුලයක් සඳහාම දේශන හා ප්‍රායෝගික ඇතුලත්ය.)

කාල සීමාව : මාස 26 යි. දේශන - සති අන්ත ඉරිදා

සම්මුඛ පරීක්ෂණය : 2021 පෙබරවාරි 06 සෙනසුරාදා සහ 07 ඉරිදා පෙ.ව. 10.00 ට

අ.පො.ස. (උසස් පෙළ) විෂයන් තුනක් සමත් අයට හෝ අදාල ක්ෂේත්‍රයන්හි NVQ 4 සහතික ඇති අයට හෝ එම සුදුසුකම් නොමැති විෂයන් 6 සම්මාන 3 ක් සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් හා උසස් පෙළ විෂයයන් එකක් හෝ දෙකක් පමණක් සමත් අයට පාඨමාලාවලට අදාළ එක් එක් ක්ෂේත්‍රයන්හි වසර 03 ක වෘත්තීය පළපුරුදුතාවය අනුව ඉල්ලුම් කළ හැක. 0728173632 ට විමසීම් කර ඇතුළත්වීම සඳහා තොරතුරු දැන ගන්න.

AQUINAS COLLEGE OF HIGHER STUDIES
Colombo 08, Sri Lanka.
COURSE CO-ORDINATOR - 0728173632
Tel; 2694014, /15, 4618689,0117389115/22
Fax: 0112678463 Website: www.aquinas.lk

09-444/1

---

## AQUINAS COLLEGE OF HIGHER STUDIES

ඇක්වයිනස් උසස් අධ්‍යාපන ආයතනයේ වෘත්තීය පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන NVQ 4 මට්ටමේ සහතිකපත් පාඨමාලාවට 2021 වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

අ.පො.ස. (සා.පෙ.) සමත් සහ අ.පො.ස. (උ.පෙ.) සමත් නොවූ අයට ඉල්ලුම් කළ හැක.

කාල සීමාව : මාස 12 යි.
දේශන - සති අන්ත ඉරිදා

සම්මුඛ පරීක්ෂණය : 2021 පෙබරවාරි 06 සෙනසුරාදා සහ 07 ඉරිදා පෙ.ව. 10.00 ට

මෙම සහතිකපත් පාඨමාලාව අවසානයේ **NVQ** 5 මට්ටමේ පාඨමාලා සඳහා ඇතුලත් වීමේ අවස්ථාව ඔබට ලැබෙනු ඇත. 0728173632 ට විමසීම් කර ඇතුලත් වීම සඳහා තොරතුරු දැන ගන්න.

AQUINAS COLLEGE OF HIGHER STUDIES
Colombo 08, Sri Lanka.
COURSE CO-ORDINATOR - 0728173632
Tel; 2694014, /15, 4618689,0117389115/22 Fax: 0112678463
Website: www.aquinas.lk

09-444/2

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**
(ISO 9001:2015 නවතම තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි)

නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
Sri Lanka Institute of Printing opens the door to a rewarding Carrier in Printing, Graphics, Multi Media & Packaging Industry

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2020**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුනයකු වන්න.

***පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ - 4 පාඨමාලාව***
***NVQ - 4 Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)***

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

*පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 22,750.*

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබාදෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද, MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

*කාලය : මාස 04 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 13,250.*

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

*කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි*

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 17,750/- NVQ 4 සහතික පත් පාඨමාලාව රු. 23,250.

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර, ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

*කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 13,750.*

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

*කාලය : මාස 04 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,750.*

### ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් හා දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

*පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 20,750.*

### නවතම 2018 වර්ෂයේ නිෂ්පාදිත වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව
### Modern Four Colour Offset Printing Machine Operation

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගීවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස් ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවකි.

*පාඨමාලා කාලය : වසර 03 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 25,750*

### ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීම ය.

*පාඨමාලා කාලය : වසර 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 20,750.*

### ආංකික පෙර මුද්‍රණය - Digital Prepress

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැළි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැක.

*පාඨමාලා කාලය : වසර 01 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,750.*

### මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබා දේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

*පාඨමාලා කාලය : වසර 01 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,750.*

### පොත් බැඳීම හා නිමාකරණය - Book Binding and Finishing

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද ප්‍රයෝජනවත් වේ.

*පාඨමාලා කාලය : මාස 07 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 23,250.*

### ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design

මෙම පාඨමාලාව මගින් මුද්‍රණ ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂයය මාලාව සකස් කර ඇති අතර, මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික් නිර්මාණකරුවකු විය හැක.

*කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,250.*

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල්වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැලි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

*කාලය : වසර 01 යි (අර්ධ කාලීන)* *මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි* *පාඨමාලා ගාස්තුව : රු. 40,750.*

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස්කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

**පාඨමාලා අධ්‍යක්ෂ,**
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන අංක : 011 2686162 , 011 2679791, 0777706995
ෆැක්ස් : 011 2686162 ඊ-මේල් : sliopreg@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

*ශාඛා* :- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.
දුරකථන අංක : 066 2222172
071 0554298.

09-520

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - (2019)2020

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 16ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ. වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ ''ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : 2020.10.19 වැනි දින වේ.

*සටහන.*-ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. *සේවයට බඳවාගැනීමේ ක්‍රමය* :

ලිඛිත විභාගයේදී සියලු විෂයයන් සමත් අයදුම්කරුවන් අතරින් විභාගයේදී ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවාගනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ /වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුන (03) ක පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළදී ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද, මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016 රු. 47,615-10 x 1,335- 8 x 1,630- 17 x 2,170-රු. 110,895 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

4. *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පස් අවුරුදු වාස්තු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.;

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම.

5. *වෘත්තීය සුදුසුකම් :*

පූර්ණ වෘත්තීය සුදුසුකම (වරලත් වාස්තු විද්‍යාඥ තත්ත්වය) ලබා තිබීම.

මෙම සුදුසුකම අංක 06 හි සටහන යටතේ බඳවා ගන්නා අයදුම්කරුවන්ට පමණක් අදාළ වේ.

6. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 36 ට නොවැඩි වීම.

***සටහන :***

අංක 5 හි සඳහන් සුදුසුකම් ලබා ඇති රජයේ සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුර දරන නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

7. *කායික සුදුසුකම් :*

(i) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

8. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ විවෘත තරග විභාගයට දෙවතාවකට වඩා පෙනී නොසිටීම.

9.

9.1 ලිඛිත විභාගය :

9.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

9.1.2 විෂයය නිර්දේශය :

| අංකය | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | කාලය පැය |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 100 | 40 | 01 |
| 02 | සාමාන්‍ය දැනීම | 100 | 40 | 02 |

විෂයය අංක 01 - බුද්ධි පරීක්ෂණය

අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, ගැටලු විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ කුසලතාව විනිශ්චය කිරීම අරමුණු කරගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

විෂය අංක 02 - සාමාන්‍ය දැනීම

ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද, ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත්වන නූතන කරුණු ද, ජාතික හා ජාත්‍යන්තර විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් අවබෝධය ද පරීක්ෂා කිරීම අරමුණු කරගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි. පළමු කොටස කෙටි ප්‍රශ්නවලින් සමන්විතය. ඒ සඳහා ලකුණු 25කි. දෙවන කොටස අර්ධ ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න 8 කින් ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතු අතර ඒ සඳහා ලකුණු 75 කි.

9.1.3 ප්‍රතිඵල නිකුත් කිරීම :

විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. එසේ ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව, පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රමුඛතා ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

9.2 සම්මුඛ පරීක්ෂණය-

9.2.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සම්මුඛ පරීක්ෂණයේ දී, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. (ලකුණු ලබාදෙනු නොලැබේ)

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

10. *විභාග කොන්දේසි* :

(i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිටිය යුතුය.

(ii) විභාග ගාස්තුව රු. 1200 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් මගින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

iii. විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

iv. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සටහන.-** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

නිවේදනයෙහි සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

v. ඉල්ලුම් පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස්කළ යුතු අතර, 1.0 සිට 2.9 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 2.10 සිට 6.0 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය 3, 4 පිටුවලට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

vi. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද

විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකිවන පරිදි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

vii. විභාගය කොළඹ දී පවත්වනු ලබන අතර දිනය පසුව දැනුම් දෙනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

viii. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

ix. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* : විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**සැළකිය යුතුය :** (*අ*) අයදුම්පතට කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(*ආ*) සම්මුඛ පරීක්ෂණයේ දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

x. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා ද සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සමාදාන විනිශ්වයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහකිරීමට කටයුතු කෙරේ.

12. මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 03 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීම සඳහා වන විවෘත තරග විභාගය 2019 (2020)**
Open Competitive Examination for Recruitment to Grade III of Sri Lanka Architectural Service 2019 (2020)

1.0 මාධ්‍යය : (විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය) :

සිංහල - 2 දෙමළ -3 ඉංග්‍රීසි - 4 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

- ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාහරණ : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාහරණ : GUNAWARDHANA, H.M.S.K.)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.5 ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.) :
..............................................................................................
..............................................................................................

2.6 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :
..............................................................................................
..............................................................................................

2.7 දුරකථන අංකය :

☐☐☐☐☐☐☐☐☐☐ ☐☐☐☐☐☐☐☐☐☐
ජංගම ස්ථාවර

2.8 ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරුෂ - 0 ස්ත්‍රී - 1

2.9 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

2.10 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

2.11 තැපැල් නගරය :————.

2.12 ජනවර්ගය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 1 දෙමළ - 2 ඉ. දෙමළ - 3 මුස්ලිම් - 4 වෙනත් - 5

2.13 විවාහක/අවිවාහක බව : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විවාහක - 1 අවිවාහක - 2

2.14 විද්‍යුත් තැපැල් ලිපිනය :————.

3.0 අධ්‍යාපන සුදුසුකම් :

3.1 උපාධිය :————.
3.2 උපාධිය ලද දිනය :————.
(මෙම සුදුසුකම් ඇතිදැයි බැලීමට නිවේදනයේ 04 කරුණාකර හොඳින් කියවා බලන්න.)
3.3 විභාග අංකය :————.
3.4 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

4.0 වෘත්තීය සුදුසුකම් :

4.1 පූර්ණ වෘත්තීය සුදුසුකම (වරලත් වාස්තු විද්‍යාඥ තත්ත්වය) සම්පූර්ණ කරන ලද දිනය :————.

5.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න. :

කුවිතාන්සි අංකය :........................
ගෙවන ලද කාර්යාලය :........................
දිනය :........................

6.0 යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න. :

..........................................................................................
..........................................................................................

7.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................හා ................. වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද මා මෙම තනතුරට පත් කර ගැනීමෙන් පසුව වුව ද මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත්

කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බවත්, එසේම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට්* නිවේදනයේ 9 (x) පරිදි විය යුතුය) ඃ

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .................................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)

9.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි) ඃ

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................. මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................. ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකි බවත් සහතික කරමි.

:

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

09-455

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 10ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නිරතව සිටින නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ. වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

(අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2020.10.19** දින වේ.

*සටහන* : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. *සේවයට බඳවාගැනීමේ ක්‍රමය* :

ලිඛිත විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත නිලධාරීන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

මෙම විභාගයේ එක් එක් විෂය සඳහා 40% හෝ ඊට ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන්ට ලබාදෙන ලකුණු, ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණුවලට එකතු කළ විට ලැබෙන මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

සීමිත ධාරාව යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවකදී එම ප්‍රමාණයද විවෘත ධාරාව යටතේ බඳවා ගැනේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළදී ලබාගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද, මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016 රු. 47,615-10x1335-8x1630-17x2170-රු. 110,895 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

4. *අධ්‍යාපන සුදුසුකම්* :

(I)

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පස් අවුරුදු වාස්තු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;

*හෝ*

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම;

*සහ*

ඉහත සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි MN 2 හෝ ඊට ඉහළ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධාරීන්,

II. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ සම්මත පාඨමාලාව - 1 කොටස සමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරීන්,

III. පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ සැලසුම් ශිල්පීන්.

5. *කායික සුදුසුකම්* :

i. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,

ii. තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

6. *වයස් සීමාව* : අදාළ නොවේ.

7. *වෙනත් සුදුසුකම්* :

i. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
ii. අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට එනම් 2020.10.19 දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. සේවයේ ස්ථිර කර තිබිය යුතුය.
iv. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට එනම් 2020.10.19 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සහ කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8.

8.1 ලිඛිත විභාගය :

8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

8.1.2 විෂය නිර්දේශය :

| අංකය | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | කාලය පැය |
|---|---|---|---|---|
| 01 | වාස්තු විද්‍යා විෂයානුබද්ධ දැනුම | 100 | 40 | 03 |
| 02 | පොදු ප්‍රශ්න පත්‍රය | 100 | 40 | 02 |

විෂය අංක 01 - වාස්තු විද්‍යා විෂයානුබද්ධ දැනුම

මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් පරිදි සකස් වේ. :-

කාලය පැය තුනයි.

I හා II කොටස්වලින් අනිවාර්ය ප්‍රශ්න දෙකකට ද (ලකුණු 20 බැගින්) අනෙක් කොටස් තුනේ ප්‍රශ්න හයෙන් හතරකට ද පිළිතුරු සැපයිය යුතුය. (ලකුණු 15 බැගින්)

සමත් ලකුණු ප්‍රමාණය 40% කි.

I කොටස - **රාජ්‍ය අංශයේ වාස්තු විද්‍යාඥයකුගේ ප්‍රායෝගික භූමිකාව**

1. රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය අතර වාස්තු විද්‍යා පරිචයෙහි වෙනස
2. වාස්තු විද්‍යාඥ භූමිකාවේ පරාසය වාසි හා අවාසි
3. ජනතාව කෙරෙහි වන වගකීම්
4. සංවිධානය කෙරෙහි වන වගකීම්

II කොටස -

1. මූලික අධ්‍යයනයන් හා විමර්ශන
2. සංකල්පමය නිර්මාණය හා මූලික ඇස්තමේන්තු සඳහා වන ප්‍රවේශය
3. රීති සැලසුම්කරණය හා ගොඩනැගීම සහ අවශ්‍ය අනුමැතීන් හා පැහැදිලි කිරීම් ලබාගැනීම
4. අදාළ පළාත් පාලන ආයතනයෙන් අනුමැතිය ලබාගැනීම සඳහා සකස් කළ යුතු සැලසුම් කට්ටලය
5. වාස්තු විද්‍යාත්මක විස්තරාත්මක ක්ෂේත්‍ර සැලසුම් සහ පිරිවිතර
6. අනෙකුත් උපදේශකවරුන් (ව්‍යුහ සැලසුම් සහ සේවා සැලසුම්) සමග සම්බන්ධීකරණයෙන් විස්තරාත්මක දත්ත සකස් කිරීම

III **කොටස** - සංවිධානයේ කාර්යයන් සහ මෙහෙයුම් මාධ්‍යය

1. සංවිධානයේ දැක්ම හා මෙහෙවර
2. සංවිධානයේ භූමිකාව හා කාර්යයන්
3. සංවිධාන ව්‍යුහය
4. සංවිධානයේ කාර්යයන් ඉටු කිරීමේදී එහි එක් එක් අංශයෙහි රාජකාරි හා වගකීම් හා අන්තර් සම්බන්ධතා
5. අනෙක් රාජ්‍ය ආයතන සමග ඇති සම්බන්ධතා

IV **කොටස** - ව්‍යාපෘතියේ පූර්ව ඉදිකිරීම් අවධිය තුළ ව්‍යාපෘතියට වාස්තු විද්‍යාඥයාගේ දායකත්වය

1. ලන්සු ලියවිලි හා ආයතන ඇස්තමේන්තු
2. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
3. පූර්ව ටෙන්ඩර් රැස්වීම් හා ටෙන්ඩර් කටයුතු
4. තාක්ෂණික ඇගයුම් හා ටෙන්ඩර් මණ්ඩල වර්ග
5. ගිවිසුම් හා කොන්ත්‍රාත් පිරිනැමීම

V **කොටස** - ව්‍යාපෘති ක්‍රියාත්මක ක්‍රියාවලිය තුළ හා පසු කොන්ත්‍රාත් අවධිය තුළ වාස්තු විද්‍යාඥයාගේ දායකත්වය

1. වැඩ බිමෙහි ප්‍රගති සමාලෝචන රැස්වීම්
2. තත්ත්ව පාලන ක්‍රියාපරිපාටි
3. ඉදිකිරීමේ කණ්ඩායම සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම
4. නිර්මිත පරිසරය තක්සේරු කිරීම හා පශ්චාත් විශ්ලේෂණ කටයුතු
5. නඩත්තු අත්පොත්

විෂය අංක 02 - පොදු ප්‍රශ්න පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය පැය 02කට සීමා කෙරේ. ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි.

I කොටස ː සියලුම විෂයයන් ආවරණය වන සේ පුළුල් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රශ්නවලින් යුක්ත වේ.

II කොටස ː ආර්ථික, දේශපාලනික, සංස්කෘතික සහ කලාව වැනි අනෙකුත් සාමාන්‍ය විෂයයන් සම්බන්ධයෙන් වූ ප්‍රශ්නවලින් සමන්විත වේ.

ප්‍රශ්න පත්‍ර ව්‍යුහය ː

- ඉහත ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න බහුවරණ හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න හෝ ඒවායේ සංකලනයෙන් යුක්ත විය හැක.
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

8.1.3 ප්‍රතිඵල නිකුත් කිරීම ː

ලිඛිත පරීක්ෂණයට පෙනී සිට සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ කුසලතා අනුපිළිවෙලට සකස් කළ, රාජ්‍ය සේවා කොමිසම් සභාවේ දැනුම් දීම පරිදි නියම කර ලද ලකුණු සීමාවකට ඉහළින් මුළු ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

8.2 සම්මුඛ පරීක්ෂණය

8.2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ː

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | 20 |
| i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධියක් | 10 | |
| ii. පූර්ණ වෘත්තීය සුදුසුකම | 10 | |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | | 20 |
| i. වර්තමාන සේවා ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රකාශන (ඒවා පළ කරන ලද මාධ්‍යයන් සහ ISBN අංක ලබා තිබේද යන්න සනාථ කළ යුතුය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| ii. වර්තමාන සේවා ක්ෂේත්‍රයට අදාළව දේශීය/විදේශීය පිළිගත් ආයතනයන්හි දරනු ලැබූ තනතුරු (අදාළ සේවා සහතික ඉදිරිපත් කළ යුතුය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| iii. වර්තමාන සේවා ක්ෂේත්‍රය තුළ ලද සම්මාන/ප්‍රශංසා (පොදු 230 ආකෘති පත්‍ර මගින් හෝ පිළිගත හැකි සහතික පත්‍ර මගින් සනාථ කළ යුතුය. - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| iv. සේවා ක්ෂේත්‍රයට අදාළව කරනු ලැබූ නව නිපැයුම් (නව නිපැයුම් ලෙස පිළිගනු ලැබූ ආයතන මගින් නිකුත් කළ සහතිකය ඉදිරිපත් කළ යුතුය - එකකට ලකුණු 01 බැගින්) | 05 | |
| 3. වෘත්තීය පළපුරුද්ද | | 55 |
| i. තනි ගොඩනැගිලි සම්බන්ධ වාස්තු විද්‍යාඥ කාර්යයන් ː<br>- නිවාස<br>- පොදු කාර්යාල<br>(වර්ග අඩි 300 සිට 500 දක්වා නිවාස හා රජයේ පොදු කාර්යාල ගොඩනැගිලි) | 15 | |
| ii. අර්ධ මහල් ගොඩනැගිලි සම්බන්ධ වාස්තු විද්‍යාඥ කාර්යයන් ː<br>- නිවාස යෝජනා ක්‍රම<br>- මිශ්‍ර සංවර්ධන ගොඩනැගිලි (තට්ටු 2 සිට 5 දක්වා) | 10 | |

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| iii. උස ගොඩනැගිලි සම්බන්ධ වාස්තු විද්‍යාඥ කාර්යයන් :<br>- නිවාස යෝජනා ක්‍රම<br>- මිශ්‍ර සංවර්ධන ගොඩනැගිලි<br>(තට්ටු 6ට වැඩි මහල් ව්‍යාපෘති)<br>iv. ජනාවාස හා ප්‍රධාන ව්‍යාපෘති සැලසුම් :<br>- නිවාස යෝජනා ක්‍රම<br>- Master Plan<br>- මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති<br>v. වෙනත්<br>- අමතර නිර්මාණ (උදා.- ප්‍රදර්ශන භූමි)<br>- සමාජ සේවා දායකත්වය<br>- (Housing Clinic)<br>- වෘත්තීයට අදාළව වෙනත් අධ්‍යාපන පාඨමාලා හදාරා තිබීම (උදා.- හරිත ගොඩනැගිලි)<br>(ඉහත කරුණු සනාථ කිරීම සඳහා පිළිගත හැකි සහතික ද ඉදිරිපත් කළ යුතුය.) | 10<br><br><br><br>10<br><br><br><br>10 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | | 05 |
| මුළු ලකුණු | | 100 |

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබාදීම හා සුදුසුකම් පරීක්ෂා කිරීම කරනු ලැබේ.

09. විභාග කොන්දේසි :

(i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර 02 සඳහා පෙනී සිටිය යුතුය.

(ii) විභාග ගාස්තුව රු. 1,000 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපතෙහි දාරයක් මගින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

(iii) විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

නිවේදනයෙහි සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(vi) ඉල්ලුම් පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, 1.0 සිට 3.2 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද, 3.3 සිට 6.0 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, ඉතිරිය 3 පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(vii) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්පත්වල හා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පතේ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබා ගෙන, නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(viii) මෙම විභාගය 2020 දෙසැම්බර් මස කොළඹ දී පවත්වනු ලබන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

(ix) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(x) *අපේක්ෂකයාගේ අනන්‍යතාව* : විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i.) ජාතික හැඳුනුම්පත,
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii.) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

*සැලකිය යුතුය* : (අ) අයදුම්පතට කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ) සම්මුඛ පරීක්ෂණයේදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගැනීම අනිවාර්ය වේ.

10. මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 03 වැනි දින,
රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම් පත්‍රය**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීම සඳහා වන සීමිත තරග විභාගය (2020)
Limited Competitive Examination for Recruitment to Grade III of Sri Lanka Architectural Service (2020)

මාධ්‍යය : විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2 දෙමළ -3 ඉංග්‍රීසි - 4 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

- ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

1.0 පෞද්ගලික තොරතුරු :

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදාහරණ* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදාහරණ* : GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.) :

..........................................................................................

..........................................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :

..........................................................................................

..........................................................................................

2.3 දුරකතන අංකය :

ජංගම : | | | | | | | | | | |

ස්ථාවර : | | | | | | | | | | |

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරුෂ - 0 ස්ත්‍රී - 1

3.2 ජන වර්ගය : [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 1 දෙමළ - 2 ඉ. දෙමළ - 3 මුස්ලිම් - 4 වෙනත් - 5

3.3 උපන් දිනය : වර්ෂය: | | | | | මාසය : | | | දිනය : | | |

3.4 ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

3.5 විවාහක/අවිවාහක බව : [ ]

විවාහක - 1 අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.6 විද්‍යුත් තැපැල් ලිපිනය :————.

4.0 *ගැසට්* නිවේදනයෙහි 7 ඡේදයේ සඳහන් දෙපාර්තමේන්තු ශ්‍රේණිවලින් ඔබේ සේවාව හා ශ්‍රේණිය (පන්තියක්, ශ්‍රේණියක් හෝ ඛණ්ඩයක් (ඇත්නම්) එය සඳහන් කළ යුතුය. සුදුසුකම් ලබා දෙන සේවා/ශ්‍රේණි එකකට වැඩි ගණනක ඔබ සේවය කර ඇත්නම් එම සේවා සහ ශ්‍රේණින් දිනයන් සහිතව සඳහන් කළ යුතුය.) :-

4.1 දැනට දරන තනතුර :————.

4.2 තනතුර අයත් සේවය (රාජ්‍ය සේවය/ පළාත් රාජ්‍ය සේවය) :————.

4.3 ශ්‍රේණිය :————.

4.4 පන්තිය/ඛණ්ඩය :————.

4.5 තනතුරට පත් වූ දිනය :————.

4.6 එම තනතුරෙහි ස්ථිර කළ දිනය :————.

4.7 උපාධිය ලැබූ දිනය :————.

5.0 *ගැසට්* නිවේදනයෙහි 7 ඡේදයේ සඳහන් කර ඇති සේවාවන්/ශ්‍රේණිවල අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ස්ථිර සහ අඛණ්ඩ මුළු සේවා කාලය :————.

6.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න. :

| |
|---|
| |

කුවිතාන්සි අංකය : ........................
ගෙවන ලද කාර්යාලය : ........................
දිනය : ........................

7.0 ***අයදුම්කරුගේ සහතිකය*** :

අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට (එනම් 2020.10.19 වැනි දිනට) පූර්වාසන්නයෙන් වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණය සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිදු ආකාරයක විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. සීමිත තරඟ විභාගයට පෙනී සිටීමට මා සුදුස්සෙකු බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............ හා ............ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුවද මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වන බවත්, එසේම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 ***දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (පෞද්ගලික ලිපි ගොනුවට අනුව)*** :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ...................................... මයා/මිය/මෙය .................. වැනි දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත් වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ලම උපයාගෙන ඇති බවද, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිදු ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බවද, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු, වාර්තා ආශ්‍රයෙන් සොයාගෙන ඇති බවද, අදාළ *ගැසට් නිවේදනයන්* හි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවද, නියමිත විභාග ගාස්තු ගෙවා එම ලදුපත අලවා ඇති බවද, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බව ද සහතික කරමි.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත් නිලධාරියාගේ අත්සන).

දිනය :————.

නම :————.
පදවි නාමය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

09-454

සංශෝධනයයි

**රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020)

අංක 2185 දරන 2020 ජූලි මස 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද '' කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2019 (2020)'' විභාග නිවේදනයේ, 8.0 යෝග්‍යතාව ඡේදයෙහි (ii) කොටස, (iii) කොටසෙහි සටහන සහ (vi) කොටස පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

8.0 ***යෝග්‍යතාවය***-

(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. එසේම අයදුම්කරු අයදුම්පත් කැඳවන අවසාන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(iii) ***සටහන*** :
2001.11.26 වැනි දිනට පෙර සේවයේ ස්ථිර කර ඇති අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට වසර 18ක සක්‍රීය සේවා කාලයක් සපුරා ඇති සහ මෙම නිවේදනයේ 8.2 ඡේදයෙන් අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර ඇති ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන සියලුම නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට අනුගාමී විභාග අවස්ථා දෙකක් ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බැවින් එම සුදුසුකම් සපුරා ඇති PL කාණ්ඩය යටතේ වැටුප් ලබන නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

(vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2020 සැප්තැම්බර් මස 28 වැනි දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

02. එම *ගැසට් නිවේදනයේ* සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින් ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2020.09.28 තෙක් දීර්ඝ කරනු ලැබේ.

03. මේ වන විටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති නිලධාරීන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස නිවේදනය කරනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 04 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

09-488

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2020)

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 34 ක් සඳහා සුදුස්සන් විවෘත පදනමින් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපත අයදුම්කරුගේ අත්සන සහතික කර අදාළ නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2020)**" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2020.10.26** දින වේ. මෙම විභාගය 2021 ජනවාරි මස කොළඹ දී පැවැත්වේ.

*සටහන.*-අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය අතර එය තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

i. ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

ii. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයින් අතරින් ඉහළම ලකුණු ලබා ඇති අපේක්ෂකයන් අනුපිළිවෙළ මත මෙම පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයකු විශේෂඥ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1894/26 සහ 2014.12.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදුකර ඇත්තාවූ ද මින් මතුවට සිදුකරනු ලැබිය හැකි වූද සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

v. ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

3. *වැටුප් පරිමාණය :*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615-10x1,335-8x1,630-17x2,170- රු. 1,10,895/- (SL- 1 -2016) වේ.

4. *අධ්‍යාපන සුදුසුකම් :*

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාළ උපාධියක් ලබා තිබීම.

හෝ

(2). i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම (මෙහි සම්පූර්ණ උපාධි පාඨමාලාවෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.)

සහ

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

5. *වයස් සීමාව* : අවම සීමාව - අවුරුදු 21
උපරිම සීමාව - අවුරුදු 35

(ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1999.10.26 දින හෝ ඊට පෙර හා 1985.10.26 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

***සටහන.***-මෙම විභාග අවස්ථාවේදී පමණක් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවල සේවයේ නියුතු නිලධාරීන්ට වයස් සීමාව නොසලකා මෙම විභාගයට පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

6. *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

7. *වෙනත් සුදුසුකම්* :
i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් මෙම නිවේදනයේ සඳහන් කරනු ලබන අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. *බඳවා ගැනීමේ ක්‍රමය* :
8.1 ලිඛිත විභාගය

8.1.1 මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | පැය 1 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය | පැය 2 | 100 | 40 |
| 3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | පැය 2 | 100 | 40 |

**සටහන.**- සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක්වත් අපේක්ෂකයා විසින් ලබා ගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50%ක්වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරුපතක් සම්බන්ධයෙන් අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන්

ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

8.1.2 විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ බහුවරණ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණයේ පරිකල්පන හැකියාවන්, තොරතුරු තාක්ෂණ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණ හැකියාව සහ දෙන ලද මාතෘකාවන්/තේමාවන් සඳහා පද්ධති විශ්ලේෂණය, සැලසුම්කරණය හා මෘදුකාංග පද්ධති හා වර්ධනය පිළිබඳ අපේක්ෂකයාගේ ශක්තිය මෙහි දී පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. (මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නව ප්‍රවණතා සහිතව මෘදුකාංග සංවර්ධනය, ස්ථාපනය හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් වන දැනුම යොදා ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අයදුම්කරුගේ අභියෝග්‍යතාව මැනීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. (මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |

8.2 සම්මුඛ පරීක්ෂණය

8.2.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සේවා ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

9. *විභාග කොන්දේසි* :

i. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාග යේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර තුනටම පෙනී සිටිය යුතුය.

ii. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (verify) සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව, එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. විභාග ගාස්තුව රු.1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

   i. ඕනෑම බැංකු ණය කාඩ්පත් මගින් (Any Bank Credit Cards)
   ii. ඕනෑම බැංකු හර කාඩ්පත් මගින් (Any Bank Debit Cards)
   iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
   iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)
   v. තැපැල් දෙපාර්තමේන්තුවේ ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at any Post Office)

**සටහන.**-ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

iv. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

v. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

vi. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**සටහන .-** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

vii. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට අයදුම්පතේ මුද්‍රිත පිටපත එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍රය නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 2 හෝ 3 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේනම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

viii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

ix. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

x. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

xi. *ප්‍රතිඵල නිකුත් කිරීම.-* ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයෙන් ලකුණු 40% කට නොඅඩුව ලැබූ හා විභාග යේ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා අනුපිළිවෙළින් පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ සකස් කළ ප්‍රමුඛතා ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ද ඇතිව රාජ්‍ය සේවා, පළාත් සභා හා

පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ.ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින.

**මෙම විභාගයට අයදුම්පත් යොමු කළ යුත්තේ මාර්ගගත ක්‍රමයට (online) බැවින්, 25.09.2020 දිනෙන් පසුව අයදුම්පත් යොමු කළ යුතු බව කාරුණිකව දැනුම් දෙනු ලැබේ.**

09-773

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018 (2020)

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 15ක් සඳහා සුදුස්සන් සීමිත පදනමින් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපත අයදුම්කරුගේ අත්සන හා ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018 (2020)" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020.10.26 දින වේ. මෙම විභාගය 2021 ජනවාරි මස කොළඹ දී පැවැත්වේ.

**සටහන :** අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය අතර එය තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වන අතර බඳවාගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1894/26 සහ 2014.12.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදුකර ඇත්තාවූ ද මින්මතු සේවා ව්‍යවස්ථාවට කෙරෙන සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

v. ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

3. *වැටුප් පරිමාණය :*
2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (SL-1-2016) අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615-10x1,335-8x1,630-17x2,170 -රු. 110,895 ක් වේ.

4. *අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද* :

4.1 පළපුරුද්ද :

(1) 2 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයකුවීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම;

*හෝ*

(2) (අ) 2 පන්තියේ II ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පත්වීම ස්ථිර කළ නිලධාරියෙකු වීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම;

*සහ*

(ආ) අංක 4.2 හි දැක්වෙන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම;

*සහ*

(ඇ) එම ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම;

4.2 අධ්‍යාපන සුදුසුකම් :

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාළ උපාධියක් ලබා තිබීම.;

*හෝ*

(2) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම (මෙහිදී සම්පූර්ණ උපාධි පාඨමාලාවෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය).

*සහ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*සැ.යු.* -මෙම අධ්‍යාපන සුදුසුකම් 4.1.1 හි දැක්වෙන නිලධාරීන් සඳහා අදාළ නොවේ.

5. *වයස් සීමාව* : අදාළ නොවේ.

6. *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

7. *වෙනත් සුදුසුකම්* :

i අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
ii අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් මෙම නිවේදනයේ සඳහන් කරනු ලබන අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. *බඳවාගැනීමේ ක්‍රමය* :

8.1 ලිඛිත විභාගය

8.1.1 මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| විෂයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | පැය 1 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමණාකරණය සඳහා අභියෝග්‍යතාව | පැය 2 | 100 | 40 |

**සටහන** :

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරුපතක් සම්බන්ධයෙන් අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

8.1.2 විෂය නිර්දේශය-

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය). |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/ සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම, නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |

8.2 සම්මුඛ පරීක්ෂණය-

8.2.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සේවා ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ලකුණු ලබාදෙනු නොලැබේ.

9. *විභාග කොන්දේසි* :

i. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතුය.

ii. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (verify) සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව, එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. විභාග ගාස්තුව රු.1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පත් මගින් (Any Bank Credit Cards)

(ii) ඕනෑම බැංකු හර කාඩ්පත් මගින් (Any Bank Debit Cards)

(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

(v) තැපැල් දෙපාර්තමේන්තුවේ ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at any Post Office)

**සටහන.**- ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

iv. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

v. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු / වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

vi. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය.

**සටහන**.- ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

vii. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට අයදුම්පතේ මුද්‍රිත පිටපත එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 2 හෝ 3 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

viii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

ix. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

x. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

xi. ප්‍රතිඵල නිකුත් කිරීම.- ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයෙන් ලකුණු 40% කට නොඅඩුව ලැබූ හා විභාගයේ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා අනුපිළිවෙළින් පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ සකස් කළ ප්‍රමුඛතා ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ද ඇතිව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ.ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පාළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින.

**මෙම විභාගයට අයදුම්පත් යොමු කළ යුත්තේ මාර්ගගත ක්‍රමයට (online) බැවින්, 25.09.2020 දිනෙන් පසුව අයදුම්පත් යොමු කළ යුතු බව කාරුණිකව දනුම් දෙනු ලැබේ.**

09-774

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.